## මී උණ වැළඳී ඇත්දැයි සැකනම් කුමක් කළ යුතු ද ?

**මී උණ යැයි සැක කළ හැකි රෝග ලක්ෂණ ඇතිනම් නොපමාව සුදුසුකම්ලත් වෛද්‍යවරයෙකු වෙත යොමුවන්න.**

**පෙර සඳහන් කළ අවදානම් ක්‍රියාකාරකම්වල ඔබ යෙදී ඇත්නම් වෛද්‍යවරයාට ඒ බව අනිවාර්යයෙන්ම දන්වන්න !**

නිසි කලට ප්‍රතිකාර ලබා නොගතහොත් වකුගඩු, හෘදය සහ මොළය වැනි අවයව වලට බලපෑම් ඇතිකරමින් මෙම රෝගය **මාරාන්තික** විය හැක.

## මී උණ වැළඳීම වළක්වා ගන්නේ කෙසේද ?

- කුඹුරු අවට පරිසරය මීයන් බෝ නොවන ලෙස පවිත්‍රව තබා ගන්න.
- කුඹුරු නියර නිසිලෙස සකසන්න.
- කුඹුරට බැසීමට පෙර සමේ සීරීම් හෝ තුවාල (යටිපතුල් පැලීම්, ඇඟිලිකරු වණවීම් වැනි) ඇති නම් ඒවා නිසි ආකාරයෙන් ජලය කාන්දු නොවන සේ ආවරණය කරන්න.
- කුඹුරු වලට මෙන්ම ජලය රැඳුනු බිම් වලට අනවශ්‍ය ලෙස බැසීමෙන්, එම ජලයෙන් නෑමෙන් හෝ අත්පා මුහුණ කට සේදීමෙන් වළකින්න.
- කුඹුරු ආශ්‍රිතව වැඩ කිරීමට සතියකට පෙර මී උණ රෝගයෙන් ආරක්ෂා වීමට ලබාදෙන ප්‍රතිජීවක ඖෂධ ඔබ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් හෝ මහජන සෞඛ්‍ය පරික්ෂකගෙන් ලබා ගන්න.

**නිසි කලට ප්‍රතිකාර සඳහා යොමු වීමෙන් මී උණ මාරාන්තික වීම වළක්වා ගත හැක !**

වසංගත රෝග විද්‍යා අංශය
සෞඛ්‍ය අමාත්‍යංශය



# මී උණ

## ලෙප්ටොස්පයිරෝසිස්

වසංගත රෝග විද්‍යා අංශය
සෞඛ්‍ය අමාත්‍යංශය

## මී උණ වැළඳෙන්නේ කෙසේද ?

- මෙම රෝගය වැළඳෙන්නේ ලෙප්ටොස්පයිරා බැක්ටීරියාව මගිනි.
- මෙම බැක්ටීරියාව මීයන් වැනි රෝග වාහක සතුන්ගේ මුත්‍රා මිශ්‍ර වූ ජලයෙහි සහ මඩ සහිත පසෙහි බහුලව රැඳී පවතී.
- සම මත ඇති සීරීම්/තුවාල හරහා හෝ නාස්/මුඛ කුහර හෝ ඇස්වල ඇති ශ්ලේෂ්මල පටල හරහා මෙම බැක්ටීරියාව සිරුරට ඇතුළු වේ.




## මී උණ වැළඳීමට වැඩි අවදානමක් ඇත්තේ කාටද ?



- කුඹුරු ගොවිතැනෙහි යෙදෙන්නන්.
- කොහිල කොටු, කීර කොටු වැනි මඩ ආශ්‍රිත වගාවල නිරතවන්නන්.
- ගංගා, කුඹුරු ආශ්‍රිතව ගඩොල් කැපීම, වැලි ගොඩදැමීම වැනි රැකියාවන්වල නිරතවන්නන්.
- පතල් ආශ්‍රිතව රැකියාවන්වල නිරත වන්නන්.
- කුඹුරු, වගුරු බිම් සහ මඩ ආශ්‍රිතව ක්‍රීඩාවේ යෙදෙන්නන්.

## රෝග ලක්ෂණ මොනවාද ?


- තද උණ



- මස්පිඩු වල තද බල වේදනාව



- ඇස් රතුවීම



ඉහත ප්‍රධාන රෝග ලක්ෂණ සමග

- වමනය
- හිසරදය
- ශරීරයේ අප්‍රාණික බව
- මුත්‍රා සමග ලේ පිටවීම
- මුත්‍රා පිටවීම අඩුවීම

වැනි රෝග ලක්ෂණද ඇතිවිය හැක.

**මෙම රෝග ලක්ෂණ මාරාන්තික සංකූලතාවල මූලික අවස්ථා විය හැක.**